

# සර්වකාලීන පියාණන්ගෙන් මෙලොවට උරුම වූ පරචිත්ත විජානන පණිවිඩය



## ඇල්ෆා සහ ඔමේගා



**සර්වකාලින පියාණන්ගෙන් මෙලොවට උරුම වූ පරචිත්ත විජානන පණිවිඩය; දෙවැනි පණිවිඩය; පලමු පණිවිඩය ආගමික පර්වතයක් හේතුවෙන් මෙලොවින් වසන්ව පැවතිණි.-**

ඔව් දරුවනි, කෙනෙක් උපදින්නෙ සත්‍ය ගවේෂණය කිරිමටයි; එය ආරම්භ වතුයේ දැනුම උදෙසායි, මෙම අනාවරණය සිදු වන තුරු සියවස් ගණනාවක් ලොව බලා සිටියේය; ඔබගේ මැවුම්කරුවාණෝ ලෝකය තවත් බලගැන්විමට සජීවී දර්ශනය උපයෝගී කරගත්තාහුය; එදවස එතුමාණෝ මොසෙයික දර්ශනය එවූ සේක; මින් පසු කිතු දර්ශනය පහල වූ සේක; එය දිව්‍යමය විද්‍යාව ලෙසද හැදින්වේ; එහි ආරම්භක ධාතූන් ස්වභාවය

ධර්මයේ ආරම්භක ධාතූත්ම වන්නේය; විශ්වයේ මැවුම්කරු සන්නිවේදනය කරනුයේ පරචිත්ත විජානනය පිලිබඳ ශුද්ධ ලියවිල්ල හරහාය; එය සෑම විටකම මේ ආකාරයෙන්ම සිදු විය; අතීතයේදී දර්ශනය දිවැසිවරුන්ගෙන් ලබාගනන්නේ පරචිත්ත විජානනය මගිනි; මන්දයත් සෑම දෙයකටම හේතුවක් සහ අරමුණක් ඇති බැවිනි; දෙවියන්ගේ දර්ශනය අනන්තය; මන්දයත් විශ්වය අනන්ත බැවිනි; එම නිසාම එය ලොව පුරා පැතිරෙනු ඇත; සියලු භාෂාවන්ට එය පරිවර්තනය වනු ඇත; එහි බලපෑම කොතෙක්ද යත් එමගින් ධනේශ්වර භෞතිකවාදය බිඳ වැටෙනු ඇත; මන්ද යත් නව සදචාර පද්ධතියක් ලෝකයට ලැබෙන නිසාය; එම පද්ධතිය සාමයේ සහශ්‍රවර්ශය කෙරෙහි බලපවත්වනු ඇත; සදාකාලික පියාණන්ගෙ දර්ශනය සෑම විටම ලෝකය පරිවර්තනය කරනු ඇත; මින් පෙර පෘථිවිය මත එය සිදු වූ අයුරින්ම; නව දේව වාක්‍ය වර්තමාන මිනිස් ආත්ම විසින් කරන ලද ඉල්ලීමකි; එය ඔබ වෙත

පිරිනමන ලදී; ඔබේ පැවැත්මේ සෑම මොහොතකම එය ඔබ විසින් අයදිනු ලැබූ පසු එය ඔබට පිරිනමනු ලැබිණි; නව දේව වාක්‍ය යනු ශුද්ධ ලියවිල්ලේ දිගුවකි; පළමු කාරණාව උත්සහවත් වීම වන අතර දෙවැනි කාරණය දැහැමි වීමයි; පළමු කාරණාව සදාතනික වේ මන්දයත් ඔබේ ආත්මය නිරන්තරයෙන් තමන්ගෙ ආරම්භය පිළිබඳ ගවේෂණය කරයි; දෙවැනි කාරණය නම් භක්තිමත් බවේ ගනුදෙනුවයි; ලෝකය පළමුව දොස් පවරනුයේ සියලුම ආගම් වලටයි; දෙවියන් වහන්සේගේ දර්ශනයේ; මානව සදාචාර පද්ධතියේ ආගම් යැයි කියගන්නා දෑ විසින් ඉන් පෙර භක්තිමත්ව තිබූ ලොව බෙදා ඇත; ඔවුනට එසේ කිරීමට අයිතියක් නොමැත; ඇත්තේ එක් දෙවියකු පමණක් බව ඔවුන් අමතක කර ඇත; ඇත්තේ එක් සත්‍යයක් පමණි; බෙදා වෙන් කළ හැක්කේ සාතන්ට පමණක් වන අතර ඔහු ඔහුවමද බෙදා වෙන් කරයි; ආගමික ආත්ම වූ කලී රෝමානු යුගයේ සිටි භක්තිමතුන්මය; අතීතයේ සිදු වූ වැරැදි නිවැරැදි

කරගැන්ම උදෙසා දෙවියන්ට නැවත උපත ලබන මෙන් ඔවුන් කන්නලව් කලහ; පරීක්ෂාව ඔවුන් වෙත ඉදිරිපත් කරන ලදී; සෑම ආගමිකයකුම අමතක නොකල යුත්තෙ,සෑම ආත්මයක්ම තමන්ගෙ ඉරණම හමුවේ පරීක්ෂාවට ලක් වන බවයි; පර්වතයේ ආත්මයන් වන ඔබ ඈත ලෝක වලදී එසේ කලහ; ඔබ අනෙක් කන්ඩායම් වෙත් කලහ; ඔබ වෙනත් සත්වයන් තුල ආත්මීය කලහ ඇති කලහ; ඔබ අනෙක් ග්‍රහලෝක භෞතික පුද භූමි වලින් පිරවූහ; ඔබ නැවතත් පෘථිවියටද එසේම කලහ; එම හේතු නිසා මුලින්ම විනිශ්වය කෙරෙනුයෙ ඔබවයි; නීතිය උල්ලංඝනය කිරීමෙන් ඔබ ක්‍රිස්තියානි විරෝධි අයකු වන්නෙය; දේව ආඥාව කඩ කරන සෑම අයකුම, ඇත්ත වශයෙන්ම එම නිසාම; ඔබ පවසාවි පූජනීය මව් පල්ලිය කියා; එත් මා ඔබට කියනවා මෙලොව කිසිවක් පූජනීය හො ශුද්ධ නැත කියා. නියම නිහතමානී බවට කවර පදවි නාමයක්වත් අවශ්‍ය නොවේ, එවැනි නාමයන් ස්වර්ගයේ

රාජධානියට අදාල වන්නේද නැත; ඔබේ ඉතා කුඩා වූ ග්‍රහලෝකයත් එසේමැයි; පෘථිවිය නැමැති ග්‍රහ දූහුවිල්ල දන්නේ පියාණන් සහ සමහර දිවැසි වරු පමණකි; එයට හේතුව නම්, ජෙහොවා පියාණන්ගෙ සජීවී විශ්වය අනන්ත විමයි; විශාල වීමට සිතන කිසිවකුත් විශාල නොවේ; වෛශ්‍යාව යන වදන ඔබ වෙනුවෙන් ලියන ලද්දකි; මන්ද යත් ඔබ ගනුදෙනු කරන්නේ මාගේ දිව්‍යමය නීතිය සමඟයි; අන්ධ පුද්ගලයන් වෙනත් අන්ධ පුද්ගලයන් විසින් මෙහෙයවයනු ලබති; ඔවුන් ඔබේ වැරදි තවත් අන්ධ පුද්ගලයන් කරා ගෙන යති; නව දර්ශනය පැතිරෙන විට, ඔබගේ ආත්මයේ ආත්මාර්ථකාමිත්වය නැමැති පර්වතය කැඩී යනු ඇත; පර්වතය යන වදන කිසිවක සදාකාලික බව හගවන්නේ නැත; පෘථිවිය සාපේක්ෂ වන අතර සදාකාලික නැත; ඔබේ පල්ලිය සදාකාලික යැයි ඔබ සිතයි; නිරහංකාර හදවත් ඇත්තවුන් පමණක් සදාකාලිකත්වය හිමි කරගනු ඇත; මාගේ පලමුව උපන් පුතු; මෙම පර්වතය

මත තම පල්ලිය ගොඩ තගත බව පැවසුවේ මානව වර්ගයාගේ අනාගතය දැක්මෙනි; මන්දයත් සූර්ය ත්‍රිත්වය සෑම තැනකම පවතී;

අතීතයේ,වර්තමානයේ,අනාගතයේ; ඔහු දුටුවේ කුමක්ද? ඔහු ඔබෙ සියලු වැරදි දුටුවේය; ඔබට වඩා වෙනස් වූ නිසා ඔබ අහිංසක සතුනට හිංසා කළ සැටි දුටුවේය; ඔබ ඔවුන්ව දණ්ඩනයට ලක් කල සැටි ඔහු දුටුවේය; ඔබගේ වැරුදි පෙන්වා දීම නිසාම ඔබ විසින් උගතුන් හා පඬිවරුන් හිංසාවට ලක් කල ආකාරය ඔහු දුටුවේය; ඇත්ත වශයෙන්ම පවතින්නේ එක් රජෙකුය , එනම් සියලුම රජුගෙන්ගේ රජු වූ දිව්‍යමය පියාණන් බව දැන දැනත්, ඔබ විසින් පෘතුවිය මත වෙනත් රජුන් කිරුළු පලැන්දු අයුරු ඔහු බලා සිටියේය; දේව ආඥාව රජවරු වීමට උගන්වන්නේ නැත; එහි ඉගැන්වෙන්නේ සෑම දෙයක් ගැනම නිහතමානී වීමටයි; දේව ආඥාව මරණය පාපයක් යැයි පැහැදිලිවම දේශනා කර තිබියදී, පියාණන්ගේ දරුවන් ඔවුන්නොඋන් මරාගන්නා දැන්

වලට ඔබ ආශිර්වාද කළ ආකාරය ඔහු දුටුවේය; භක්තියේ ගනුදෙනුව ඔහු දුටුවේය; ඔබේ ආත්මයේ සෑම දුරාචාරයක්ම ඔහු දුටුවේය; නැවතත් හිංසනයට පත් වනවාට වඩා නැවත උපදින්නේ නැතිව හිඳීම යහපත්ය; ස්වර්ගය ඔබගේ ආගම හඳුනන්නේ නැත; එමෙන්ම පියාණන්ගේ දරුවන් බෙදා වෙන් කිරීමට වෙර දරන සදාචාරයන් හඳුන්නෙත් නැත; ස්වර්ගය හඳුනන එකම පූජනීය ස්ථානය නම් කර්මය නමැති පූජනිය ස්ථානයයි; පවතින පැරණිතම නියෝගය නම් ක්‍රියාවයි; ඔබගේ ඉතා කුඩා ලොව බිහිවීමට ප්‍රථම සහ දැනුත් කර්මය ඉතා සුවිශාල ලෝකවල පිළිගනු ලබයි; කර්මයේ පූජණිය ස්ථානය කිසි කලෙකදී දුහුවිලි බවට පත් වන්නේ නැත; ඔබේ භෞතික පූජනියස්ථාන එසේ දුහුවිලි බවට පත් වෙයි; ඒ සමගම භෞතික නමස්කාරය අවසන් වෙයි; එය කිසි දිනෙක ඉගැන්විය යුතු නමස්කාරයක් නොවේ; මන්ද යත් එම නමස්කාරයේ කුහකත්වය පවතී; ඔබ ලොකයේ ඉදිරි ගමන සදාචාරය සහ අධ්‍යාත්මික යන

අංග දෙකෙන්ම, සියවස් විස්සකින් පමණ අඩාල කොට ඇත.-



ඔව් කුඩා පුතණුවනි; මෙම දිව්‍යමය චිත්‍රයෙන් පෙන්නුම් කරන්නේ යුක්තිය බිහි වන්නෙත් ජීවය බිහි වන ආකාරටම වන බවයි; සියලුම මනුෂ්‍ය ආත්මයන් මෙම යුක්තිය ස්වර්ගයෙදි අත් දැක්කහ; මන්ද තමන්ගෙ යුක්තිය දැකීමෙ අයිතිය සියල්ලටම ලබා දෙන ලදි; ස්වර්ගයෙ සෑම දෙයක්ම පවතී; ආධ්‍යාත්මික වශයෙන්

සලකන කල කිසිවකු අන්ධව මෙලොවට පැමිණියේ නැත; ඔබගේ ක්‍රියා අනුව යුක්තිය හැඩ ගැසෙයි; මන්දයත් සෑම අයෙක්ම තමන්ගෙ ස්වර්ගය තමන්ම ගොඩනගා ගැනීමට දිව්රුම් දී ඇති බැවිනි; යුක්තියේ නීතිය සජීවී දේව ආඥාව තුල බල පවත්වයි; එම මිනුම් දණ්ඩෙන්ම ඔබවත් මනිනු ලැබේ; ඔබෙ සෑම අදහසකටම අරමුණක් ඇත; ඒ සෑම අරමුණක්ම ස්වර්ගයේදී භෞතික හා සජීවී වනු ඇත; ආධ්‍යාත්මය විසින් අරමුණ කෙලෙසූ විටෙක එම අරමුණ විනිශ්චය කෙරුණු ඇත; මනුෂ්‍ය සිරුර යනු මහා සක්වලින් බිහි වූ චුම්බක බල වල ප්‍රතිපලයකි, ඒවා දිව්‍යමය බල නම් වේ; යමකු ක්ෂුද්‍ර මට්ටමෙන් දිව්‍යමය භාවය ප්‍රතික්ෂේප කරන්නේද, ඔහු තම දරුවන් වෙනුවෙන් හොඳම දේ පතන තම පියාණන්වද ප්‍රතික්ෂේප කරන්නේය; යමෙක් තම පියාණන් ප්‍රතික්ෂේප කරන්නේ නම් ඔහු තම සදාකාලික බව ප්‍රතික්ෂේප කරන්නේය; මන්දයත් අනන්ත වූ දෙව් ලෝකවලදී ඔවුන්ගේ සිත් කියවනු ලබන නිසාය; එසේම

එම දිව්‍යමය සත්වයන් විසින් සිත් කියවද්දී එය කෙරෙනුයේ විනිශ්චය තුළිනි; යමෙක් තම පියාණන් ප්‍රතික්ෂේප කරන්නේ නම්,එම පුද්ගලයා දෙව් ලොවට ඇතුළු වීමද ප්‍රතික්ෂේප කෙරෙනු ඇ; ඔබ මෙලොවදී කරන සෑම දෙයකටම ප්‍රතිවිපාකයක් එලොවදී අත් වනු ඇත; ඔබේ ආත්මය කොහි ගියද, නීතිය එකම වනු ඇත; මාගේ විදි නියෝග ඉහළදීත් පහළදීත් එකම වනු ඇත; වෙනස් වනුයේ ඒ මොහොතේ බල පවත්නා දර්ශනය පමණකි; ඔබේ යුක්තිය ආධ්‍යාත්මිකය, ඉදිරියටත් එසේ වනු ඇත; භෞතික වස්තූන් ඔබේ ජීවිතයෙ සදාකාලිකව රැඳෙන්නේ නැත; ඔබේ දැනුම අනුව සෑම ආත්මයකම පරම යථාර්ථය යනු සදාකාලික බවයි; එය භෞතික ශරීරය හිමිව පැවතියදී දැනුන අල්පකාලික බව නොවේ; මාංශයෙන් සැදුම් ලද සිරුරක් පතන ලද කල, එයට අවසර දෙන ලදී; එම අවසර දීම වෙන කිසිම අවසර දීමකට සමාන නොවේ; එම ශරීරය විසින් පතන ලද හැඩ තල වලටද අවසර පිරි නමන ලදි, ආවේණිය සෑම

කෙනෙක්ටම පොදුවේ; පදාර්ථ සහ ආධ්‍යාත්මය යන දෙකටම ඇත්තේ එකම අයිතීත්‍ය; ඒ අංග දෙකම ඉල්ලීම් කරති; ඒ අංග දෙකේම නීති ඒකාබද්ධ වේ; එය ස්වර්ගයේදී ගිවිසුමේ නෞකාව ලෙස හැඳින්වේ; ආධ්‍යාත්මය ද්‍රව්‍ය බවට පත් කිරීමේ ක්‍රියාවලිය අහම්බයක් නොවේ; එය ඇඩ් වගකීමෙන් සිදු කෙරේ; එය එසේ නොවේ යැයි කීම කෙනෙක්ව නින්දාවට ලක් කිරීමක් වෙයි; යමෙක් තමන්වම නින්දාවට ලක් කර ගන්නෙ නම්; ඔහු තමන් තුල සිටින දෙවියන් වහන්සේ නින්දාවට ලක් කරන්නේය; ඔබේ නිර්මාතෘවරයා සෑම තැනකම සිටින බව ඔබට උගන්වා නැතිද? සිතා ගත හැකි හා නොහැකි ආකාර වලින්; ඇත්තෙන්ම ඔබ එය දන්නේ කට වහරින් මිස ඔබේම දැනුමෙන් හෝ උත්සාහයෙන් නොවේ; එහෙත් තමන්ගෙ උත්සහයෙන්; කැපවීමෙන් සොයන්නාට එතුමා හමු වේ; මන්දයත් වෙහෙස වන්නාට තමන්ගෙ වෙහෙසට සරිලන සේ පාරිතෝෂික ප්‍රධානය කෙරෙන බැවිනි; ඔබට මෙම

ජීවිතයේදී බොහෝ දේ ගවේෂණය කළ හැක; එසේ තිබියදීත් ඔබ, ඔබට ජීවිතය ලබා දුන් පියාණන් පිළිබඳව ගවේෂණය නොකරන්නේ නම් ඔබට ස්වර්ගයට ඇතුළු විය නොහැකිය; කෘතවේදී නොවෙන්නන් කිසි දින ඇතුළු වී නොමැත; නිහතමානීව තම ජීවන ගමනේ පරීක්ෂා වලට බඳුන් වූවෝ පමණක් ඇතුළු වනු ඇත; මන්දයත් එම පරීක්ෂණයන් නිහතමානී අය විසින් බලාපොරොත්තු වන ලදී; කෙනකු ජීවිතයේ සෑම මොහොතකම ලක් වන සෑම පරීක්ෂාවක්ම ඔවුන් විසින් අයදින ලදුව ඔවුන්ට ප්‍රධානය කරන ලද ඒවාය; ඔබේ මරණය සිදු විය යුතු ආකාරය සහ එහි ලක්ෂණ පවා ඔබ විසින් අයදින ලද ඒවාය; ඔබ මුහුණ දුන් පරීක්ෂාවන් තුළින් ඔබ උසස්ම සදාචාර ගුණ සම්පූර්ණ කිරීමට අයදින ලදී; මන්ද යත් එවැනි සදාචාර වලින් තොරව ඔබට ස්වර්ගයට ඇතුළු වීමට නොහැකිය; එවැනිම ගුණධර්ම පෘතුවිය මත ඉගැන්වීමට අයදින ලද්දේ ඔබ විසිනි; ඉන් පසු දේව ආඥාවන් ඔබ වෙත

දායාද කරන ලදී; ඒවා මිනුම් දඬු වේ; ඒවායින් ඔබව මනිනු ලැබේ; ඒවා මෙම පෘථිවියෙහි පරිපූර්ණත්වය පිණිස හේතු වේ; එමෙන්ම මනුෂ්‍ය ආත්ම වලට කිසි දින මා අධ්‍යනය කළ නොහැක; එනමුදු මාගේ දේව ආඥාව අනුව සදාචාරාත්මකව දිවි නොගෙවීම අන්ධකාරයේ දිවි ගෙවීමකි; මන්ද යත් එවිට ඔබට කිසි දිනෙක පියාණන්ගේ සෙවණට ළඟා වීමට නොහැකි වනු ඇත; ඔබ ආලෝකයෙන් ඈත් වී ගත කරන කාලයේදී අපූර්වතම දෑ ඔබට අහිමි වනු ඇත; ඔබගෙ ඉතාම කුඩා පරිණාමයේදී ඔබට අහිමි වූ අංක දැන ගැනීමට ඔබට නැවත උපත ලැබීමට සිදු වනු ඇත; ඔබ ආයාචනා කරනු ලැබූ යුක්තිය ආරම්භ වනුයේ ඔබේ මනසෙහි හටගන්නා ඉතාම කුඩා අදහස සමගිනි; එය එසේ විය යුතුය, මන්ද යත් ඕනෑම දෙයක ආරම්භය ඉතාම කුඩා නොගිනිය හැකි දෙයකි; ස්වර්ගය හා එහි දිව්‍යමය යුක්තියේදී පලමුවන්; දිව්‍යමය පියාණන් වන ජෙහොවා ඉදිරියේදීන්; එමෙන්ම ඔබෙගේ මනසේ ඇති විය හැකි කුඩාම දෙය

ඔබගේ සිතුවිලි වේ; ඔබ දිනපතා ජනනය කරන සිතුවිලිම වේ; ඔබ ස්වර්ගයෙදී අයදින ලද ඒවාම වේ; ඔබට දැනෙන එහෙත් නොපෙනෙන ඒවාම ව; ඔබේ සියලු අදහස් භෞතිකව විශ්වයට ගමන් කරයි; එම සිතුවිලි වලටද ඔබට වාගේම අයිතියක් ඇත; ඔබ පදාර්ථමය වශයෙන් උපත ලැබීමට ආයාචනා කලේය,ඒවාද එසේම ආයචනා කළහ; කාලය හා අවකාශයේ ජීවත් වීමට ඔබ ආයචනා කලේය; ඔබේ අදහස්ද එසේය; ඉහළ පවතින්නේද පහළ පවතින දේවල්මය; ඉල්ලීම්වල උරුමය සියල්ලටම එක හා සමානය; මහා සත්වයොද ක්ෂුද්‍ර සත්වයෝද ආයාචනා කරති; සජීවී පදාර්ථයන් ආයාචනා කරන සේම සජීවී හිස් බවද ආයාචනා කරයි; සියලු දේම දෙවියන් විසින් ප්‍රධානය කරනු ලබයි; මත්ද උත්වහන්සේ අනන්තය; ඔබේ අදහස් විශ්වය හරහා පෙර නොවූ විරූ, ඔබට ගණනය කළ නොහැකි, උත්වහන්සේ පමණක් දන්නා දුරවල් ගමන් කරයි; ඔබගේ අදහස් මන්දාකිණි බීජයන් ලෙස ස්වර්ගය හඳුනා ගනියි;

ඒවායින් ඔබේ ලෝකයත් බිහිවේ; එය මාගේ ස්වකැමත්තයි; සෑම අයකුම තමාගේම ස්වර්ගය ගොඩනඟාගනියි; මන්ද ඔබ සෑම අයකු තුලම ශුද්‍ර ප්‍රමාණවලින් පියාණන්ගේ උරුමය පවතී; සාමාන්‍ය මනුෂ්‍යයන් අතරද පියකු සතු දෑ තම දරුවන්ට උරුම වේ; ඉහළ ක්‍රියාවලියද පහළ ක්‍රියාවලියට සමාන වේ; ඔබේ පියාණන්ගෙන් ඔබට දායාද වන උරුමය අවිහිංසකය; මන්ද තෝරා ගැන්ම ඔබගේ ස්වකැමත්තයි; ඔබ අත් පත් කරන්නා දෑ ඔබගේ කැපවීම හා උත්සහය නිසයි; එම නිසා ඔබ කළ කී දෑ ඔබගේ ආනිශංසයයි; පියාණන් මැවීමෙහි කිසිවක් මිලකින් තොරව ලැබෙන්නේ නැත; සෑම දෙයකටම වටිනාකමක්, මිලක් පවතී; මන්දයත් කුසල ආනිශංස නොමැතිව කිසිවකුට ස්වර්ගයට ඇතුළු විය නොහැකිය; දෙව් ලොව සැප සම්පත් ඔබගේ ලෝකයට වඩා බොහෝ ඉහළින් පවතී; කිසිම භෞතික චින්දනයක් ස්වර්ගයේදී කුසලානිසංශයක් වන්නේ නැත; විශේෂයෙන්ම එවන්

චින්දනයන් දේව ආඥාවට විරුද්ධ වේ නම්; එවන් ඉගැන්වීම් දිගු කලක් පවතින්නේ නැත; මන්දයත් නිර්මාතෘන් වහන්සේ ප්‍රධානය කරන්නා සේම නැවත ලබා ගනී; ඔබගේ භෞතිකවාදී මූලධර්ම සීමා වනු ඇත; මන්දයත් සෑම දෙයකටම කාලයක් පවතී; සියල්ලම දේව ආඥාවට අනුව සාපේක්ෂ වේ; එය ඔබ මුහුණ දුන් පරීක්ෂා වලදී ඔබ ආයාචනා කළ සාපේක්ෂතාවයයි; ඔබේ ජීවන ක්‍රමයේ බිඳ වැටීම යනු ඔබේ බන්ධනයෙ බිඳ වැටිමයි; නිහතමානී පුද්ගලයන්ට එය මහා සංසිද්ධියක් වනු ඇත; සූරාකෑමක් හා අවමන් කිරීමක් වනු ඇත; දෙවියන් වහන්සේ ඉදිරියේ සියල්ලම සමාන වේ; එම නිසා කිසිවකු දුප්පත්ව හෝ පොහොසත්ව උපදින්නේ නැත; එවැනි තත්වයන් උදාවූයේ මේ මොහොතේ පමණක් පවතින, අපේක්ෂා සහගත ආත්මයන් හේතුවෙනි; ඒ ආත්ම තම පරිණාමයේදී ඉතාම පසුගාමී වූහ; මෙම අල්පකාලික ආකල්ප නිසාම ඔවුන් ලොව යටත් කර ගත්හ; මේ සියලුම යක්ෂයන් ලෝකය විසින්ම

විනිශ්චය කෙරෙනු ඇත; මන්ද යත් කිසිවකු තම ආත්මය නින්දාවට ලක් වනවාට කැමති නොවෙති; දෙවියන්ගේ දර්ශනයේ ආලෝකය ලොව වෙනස් කරනු ඇත; ස්වර්ගයේ ලියැවී ඇත්තේ ඒ ආකාරයෙනි; පෘථුවිය ක්‍රියා කොට ඇත්තේ ක්‍රියා කිරීමට උපදෙස් ලැබී ඇති ආකාරයට විරුද්ධ ආකාරයෙනි; සියවස් ගණනාවක් මුලුල්ලේ මාගේ දේව ආඥාවල එසේ ලියැවී පවතී; ඕනෑම පිළිවෙලක පලමුව සිටින්නේ නිහතමානී අයවලුන්‍ය; ඔබ දේව ආඥාවට කුමක් කලේද? ඕනෑම දෙයක පලමුව සිටින නිසා මාගේ නිරහංකාර ඉතා සුළු අයවළුන් ලෝකය පාලනය කරන්නාහුද? ඇත්ත වශයෙන්ම නැත; ඔවුන් නින්දාවට ලක් වී ඇති බව මට පෙනී යයි; ඔවුන්ට ඔබ ඉහළ පැළැන්තිය යැයි හඳුන්වන අමරණීයත්වයේ කොටසක් බවට පත්වීමට නොහැකි වී ඇත; එවැනි පැළැන්තියක් ඇති කිරීමට ඔබට අයිතියක් දී ඇත්තේ කවරෙක්ද? එය මාගේ ශුද්ධ ලියවිලි වල කොහේ හෝ සඳහන් වී ඇතිද? ඇත්ත වශයෙන්ම මා අහංකාර

නිස්සාර යක්ෂයන් වන ඔබට පවසනුයේ නිර්මාතෘන් විසින් පැළ නොකරන ලද සියලුම වෘක්ෂයන් මුලිනුදුරා දැමෙනු ඇත; සෑම සජීවී පරිණාමයක්ම ඒ අයුන් සිදුවී ඇත; ඔබව නිර්මාණය කොට ඔබව රජුන් බවට පත් කළේ කවුරුහුද? එකම පියාණන් රජුන්ගෙන් රජු බව තුඹ නොදන්නේද? රජු යන තත්වය මෙලොවට අයත් එකක් නොවන අතර එය අයත් වන්නේ දෙව් ලොවටයි; මෙහි සාතන් අධ්‍යාත්මික රජු ලෙස හැඳින්වේ; දිව්‍යමය දේව ආඥාව සියල්ලටම පෙර නිහතමානී වීමට උගන්වයි; එය තමන්ම රජ වීමට උගන්වන්නේ නැත; රදළ පැළැන්තියේ ශාප ලත් යක්ෂයන් වන ඔබට මා තරයේ කියා සිටින්නේ ස්වර්ගයට ඇතුළු විය නොහැකි බවයි; ඔබත් සමගම ඔබගේ නෙවැනි පරම්පරාව වන නෙක් දරුවන්ටද ඇතුළු විය නොහැකිය; මන්ද යත් ජෙහෝවා පියාණන්ගේ සජීවී විශ්වයේ සෑම ප්‍රවේණියක්ම නොවරදීම සම්ප්‍රේශණය වේ; අවම වශයෙන් ඉතා කුඩා වූ තත්පරයක තරම් වූ කාලයක්වත්

අපතේ නොයයි; මන්දයත් තත්පරයකටත් අඩු කලකදී වුවද සිදු වන පාපයක් වුවද ස්වර්ගයට ඇතුළු වීම වලකයි; ශාප ලත් රජ වරුනි, ඔබේ අහිංසක දරුවන් ඔබට ශාප කරනු ඇත; මන්ද ඔබ නිසා ඔවුනටද ස්වර්ගය අහිමි වන බැවිනි; ඒ සමඟම ඔබේ ශාපලත් දර්ශනය පිලිපදින එකදු ගැහැනියක් හෝ පිරිමියකු හෝ, රදළ යැයි කියා ගන්නා එකදු යක්ශයකු හෝ ස්වර්ගයට ඇතුළු නොවනු ඇත; මන්ද එම දේශය හඳුනන්නේ විශ්ව මූලධර්මය වන පුණ්‍යකර්ම පමණකි; සියලු නිරහංකාර, අවංක සුළු ජීවීන් විසින් ආයචනා කළේ එයයි; පෘතුවිය මත රජවූ අයගේද, ආත්ම විසින් තුච්චත්වයෙන් රවටනු ලැබූ අයගේද ආත්මවලට අනෙකුත් ජීවීන්ගේ පැවැත්ම අති ප්‍රබල ලෙස බලපායි; එම පැවත්මෙහි දිව්‍යමය දීප්තියක් හැරුන කොට බුද්ධිමය හරයක් නොමැත; යම් ලෝකයක රජ කෙනෙකුව නොසිටි සාතන් කෙනෙකු නොමැත; මෙම දර්ශනය මෙහෙයවනු ලබන්නේ සාතන් විසිනි; ඔහු විප්ලව කිරීමට පටන් ගත් මොහොතේ සිටම

ඔහු විසින් මෙහෙයවෙයි; ඔහු හා එක්ව විප්ලව කල හමුදා සේනාද, රජකු විසින් මෙහෙයවනු ලබන ජාතියක් ලෙස කල්ලි ගැසීමට ආයාචනා කළ වුන්ද; සාතන්ගේ සේනාවට අයත් වේ; ඔබ සියල්ලන්ම පැමිණියේ ස්වර්ගයෙනි; යක්ෂයා පැමිණියේද එතැනිනි; ඔබ අතර සිදු වනවා සේම එසේ ස්වර්ගයේ සිටියදී ආත්ම වෙනත් සත්වයන්ගේ පුරුදු හුරු වී සිටිති; ඉහළත් පහළත් සිදු වන්නේ එකම ක්‍රියාවලියයි; සාතන්ගේ අනුගාමිකයන් ආගමික අය ,ධනවත් අය හෝ රජවරුන් අතර සිටිති; මොවුන් බලවේගයේ ප්‍රතිපත්ති බිහි කරන ශාපලත් අයවළුන් වේ; එහෙත් කිසිම යක්ෂයකු ඉතිරි වන්නේ නැත; දිව්‍යමය පියාණන්ගේ සජීවී වදන සියල්ලම පිරිසිදු කරයි; සියල්ල පරිවර්තනය කරයි; ඔහු පලමුව මෝසේක ධර්මයෙන් පසුව කිතු දහමෙන් හා අවසන දෙවියන්ගේ බැටළුවාගේ දහමෙන් ලොව වෙනස් කල අයුරින්ම; තමන් විසින්ම මාංශයෙන් මවන ලද ලෝකය තම සජීවී වචනයෙන් වෙනස් කිරීම තරම් පහසු යමක්

විශ්වයේ මැවුම් කරුවාට තවත් නොමැත; දිව්‍යමය මොහොතකට පෙර ආලෝකය පවතීවා යයි පවසා ආලෝකය මැවූ වචනයමයි; සෑම ශුද්ධ ලියවිල්ලක්ම මැවූ වචනයමයි; ඔබට දේව ආඥාව දායද කළ වචනමයි; පලමුව බුද්ධිමත් බව සහ ඉන් පසුව භෞතික නීති පිලිබඳව ඔබව විනිශ්චය කරන වචනයමයි; මන්දයත් සෑම ආත්මයක්ම ආයාචනා කළේ ඒ ආකාරයටම බැවිනි; ඔවුන් ආයාචනා කළේ ජීවිතයේ සෑම මොහොතකම වාගේ අවසන් විනිශ්චයයේදීද පරීක්ෂාවට ලක් වීමටයි; මාගේ ශුද්ධ ලියවිල්ල අවබෝධ කරගැනීමේදී ඇති වූ අපහසුතාවල සිට සෑම දෙයක්ම ඔබ ඉල්ලුම කළ ඒවාය; දෙවියන්ගේ බැටළු වාගේ දහමේ ඉතාම කුඩා විස්තර පවා; ඔබම ස්වර්ගයේදි ආයාචනා කොට ඇති අයුරින් ඔබට අදෘශ්‍යමාන දෑ පවා ස්වර්ගයෙන් පාලනය වේ; ඔබට ගෝචර නොවෙන සන්වේදනා; ඔබේ සිතුවිලි, අදහස්, අරමුණු වලට අත් විය යුතු යුක්තිය; ඔබම ස්වර්ගයේදී එසේ ආයාචනා

කොට ඇත; ඔබ ඔබේ මූලාරම්භයෙහි අභාවයද එසේම ආයාචනා කොට ඇත; එසේම ඔබව මැවූ ආකාරය හා එහි විස්තරත් , නමුත් ඔබට සෑම දෙයක්ම දැන ගැනීමට හැකි වනු ඇත; මන්ද ඔබ පෘතුවියේදී දෙවියන්ගේ බැටළුවාගේ ආලෝකය දැන ගැනීමට ආයාචනා කළ නිසාය; ඔබව දැනුමෙන් අස්වසාලන්න යැයි ඔබ ආයාචනා කලේය; ඔබ නව දර්ශනයක් ඉල්ලුම් කලේය; මෙම දර්ශනය පහළ වීම නිසා ඇති වූ පුදුමය ඔබම ඉල්ලුම් කළ එකකි; එය මීට බොහෝ කලකට පෙර පහල විය යුතුව තිබින; පූජනිය පර්වතයේ දිව්‍යමය භාවය හා විශ්වාසනිය නොවන බව නිසාම සත්‍ය ඔබෙන් සැඟව පැවැතින; ඔවුන් සතුව දෙවියන්ගේ බැටළුවාගේ පූජනීය ලියවිලි පැවැතින; පළමු ලියවිලි ඔවුන්ගේ දෑතට දෙන ලදි; මන්ද ඔවුන්ව පරීක්ෂාවට ලක් කරන ලදි; සෑම ආත්මයක්ම පරීක්ෂාවට ලක් වෙයි; තමන්වන් පිලිනොගන්නා පිලිගැනිමක් උගන්වන මොවුන් යක්ෂයන් වේ; ඔවුන් පලමුව සත්‍ය දැන ගැනීමට ඉල්ලීම් කළහ;

එම ඉල්ලීම ඔවුන්ට ප්‍රධානය කරන ලදී; ඔවුන් සත්‍ය සැඟවූයේ ඔවුන්ගේ හදවතෙහි වූ ආර්මාර්ථය නමැති ගල නිසාය; මෙම පරම්පරාව මෙන්ම මින් මතු පරම්පරාවන්ද ඔබට සාප කරනු ඇත; ඔබ වැනි යක්ෂන් නිසා මෙම මනුෂ්‍යත්ව ස්වර්ගයට ඇතුළු නොවනු ඇත; මන්ද ගෙවුණු සෑම තත්පරයක්ම හිංසනයයෙන් ගෙවුණේ වෙයි; තත්පරයක හෝ ඊටත් අඩු කාලයක් තුළ පමණක් හිංසාවක් සිදු වුවත් ස්වර්ගයට ඇතුළු නොවීමට එය ප්‍රමාණවත්ය; ඔබ ලෝකයෙන් සත්‍ය සැඟවීමෙන් මනුෂ්‍යත්වය තව තවත් ස්වර්ගයෙන් ඈත් කළේය; මන්ද ඔබ පාපය තව තවත් චිරස්ථායි කළේය; වරදෙහි ජීවත් වූ තත්පර ගණන ඉතා වැඩිය; ඔබ සෑම කෙනෙකුම වසරකදී ඔබ ජීවත් වූ තත්පර ගණන, ගණන් බැලිය යුතුය; ඒ වයස දොළොහ පසු වූවායින් පසුවය; ඊට බාල වියේදී සෑම ආත්මයක්ම දෙවියන් ඉදිරියේදී අහිංසකය; මාගේ අහිංසකයන්ට එක් තත්පරයකදී හෝ අවැඩක් කළවුන් ස්වර්ගයට ඇතුළු

වන්නේ නැත; මන්ද යත් ලියැවී ඇත්තේ තමන්ට අනුන් සලකනවාට අකමැති ආකාරයට තමන් අනුනට නොසැලකිය යුතු බවයි; එම නිසාම තරක පියකු, මවක, සුළු පියකු, කුඩම්මා කෙනෙකු මාගේ දේශයට ඇතුළු වන්නේ නැත; ඔවුන්ගේ දෛවයන් මාගේ අවිහිංසකයන්ගේ යුක්තියට භාජනය වනවා ඇත; මන්ද සෑම කුඩා අයකුම මාගේ ස්වර්ගයේදී විශාල වේ; සෑම නිහතමානී සුළු අයෙක්ම දෙවියන් ඉදිරියේ මූලිකත්වය ගන්නා බව ඔබට උගන්වා නැතිද? මෙයින් පැහැදිලි වන්නේ සෑම ක්ෂුද්‍ර දෙයක්ම ජෙහෝවා පියාණන්ගේ යුක්තිය ඉදිරියේ මූලික වේ; එම නිසාම ඔබේ ආත්මය ස්වර්ගයේදී මූලික නොවේ; මූලික වන්නේ ඔබේ ආත්මය විසින් ගර්හාවට ලක් කල අයයි; ඔබේ ආත්මයට ප්‍රමුකතාවය ඉල්ලීම් කළ නොහැකිය; මන්ද ඔබට නියෝග කොට තිබුනේ අන් සෑම දෙයකටම වඩා නිහතමානී වන ලෙසය; අවසන් කෙනා සෑම විටම නිහතමානීය, සරලය; ඔහු තමන්ට වැදගත්කමක්

නොදෙයි; ඇත්තවශයෙන්ම මා ඔබට කියනුයේ තමන්වම වැදගත් කොට සලකන්නා ස්වර්ගයට ඇතුළු නොවේ; එම නොගැළපෙන වැදගත්කම තත්පරයකට අඩු කළක් පමණක් පැවතුනද; එසේ වැදගත්කමක් ආරූඪ කරගත් දුෂ්ට සිත් ඇති කිසිවකු ස්වර්ගයට ඇතුළු නොවේ; මෙම මනුෂ්‍යත්වයේ බිඳවැටීම වැරුදි මෙත්ම ලෞකික සංකල්පයක් නිසා සිදු විය; එය ඔබ තුළට කාන්දු වූයේ පූජනීය පර්වතයේ වැරදි සදාචාර ඉගැන්වීම නිසාය; සියවස් ගණනාවක් මුලුලේ වෛශ්‍යාව විශ්වාසයෙන් ගතුදෙනු කොට ඇත; ඇයගේ තාවකාලික ආශාවන්ට අනුව කටයුතු කොට ඇත; ඇය සරල නිහතමානී අයවළුන් සැලකිල්ලට ගත්තේ නැත; නිහතමානී අය සුඛෝපභෝගී ජීවිත ගත කරන්නේ නැත; ඔවුන්මව රවට්ටාගත්තේ නැත; මන්ද සෑම සරල නිහතමානී අයකුම අපකීර්තිමත් කාල පරිච්ඡේදයක් ගත කරයි; සෑම භෞතික වාදියකුම ඉතාම ක්ෂුද්‍ර වර්තමානක් පතන පසුගාමී ආත්මකි; තව දුරටත් ආත්මයන්ට අදාළ නීතින්

පිළිබඳව නොසැලකිලිමත්‍ය; පාප් වහන්සේ යැයි කියා ගන්නා අයගේත් ලක්ෂණ එසේමැයි; මෙවැනි සත්වයන් ස්වර්ගය හඳුනන්නේ නැත; මන්ද එවැනි කිසිවකු මෙතෙක් ඇතුළු වී නැත; කිසිම ආගමක් හඳුනන්නේ නැත; එසේ වී ඇත්තේ අනන්ත වූ නීති නිසාය; එයින් එකක් නම් විශ්වය අනන්ත වීමයි; කෙතරම් අනන්ත වේ දැයි කිවහොත් සෑම මවාගැන්මකම සත්‍යයක් විය හැකිය; අනෙක් නීතිය නම් කෙනෙක් තමන්ගේම ස්වර්ගය තනා ගැන්මයි; අන්න ඒ ආකාරයෙන් පාප් වරුන් හා ඔවුන්ගේ අනුගාමිකයන් භෞතික වටිනාකමින් යුතු දර්ශනයක් හා ඒ තුළින් ඔවුන්ගේම ලොවක් තනා ගත්හ; මන්ද සෑම ලෝකයක්ම දෙව් ලොවකින් වටවී ඇත; සෑම අයකුම තමන්ගේම ස්වර්ගය තනා ගනී; භෞතික වටිනාකම යනු දෙව් පියාණන් විසින් පැල කළ වෘක්ෂයක් නොවේ; එය ස්වර්ගය හඳුනන්නේ නැත; එය මාගේ අවිහිංසකයන් නොසලකා හරින කිසිම දර්ශනයක්, විද්‍යාවක් හෝ සම්ප්‍රදායක් හඳුනා ගන්නේ

නැත; මන්ද මා ඉතා පැහැදිලිව ඔබට කියා සිටිනුයේ මෙම ලෝකය පාලනය කළ යුත්තේ සරල, නිහතමානී අය විසින් බවයි; මන්ද දේශයේ වඩාත් මූලික වන්නේ නැත; ඉහළදී වඩාත් මූලික වන්නේ ඔවුන් වන අතර පහළදීද එසේම විය යුතුය; නමුත් සිදු වී ඇත්තේ එහි අනෙක් පැත්තයි; මෙලොව පාලනය කරන්නේ දේශයේදී ඒ සඳහා ආයාචනය නොකළ අය විසිනි; අන්ධකාරයේ ආත්මයන් විසින් ඔබව පාලනය කරමින් ඇත; මන්ද ඔවුන් සිටින තත්ත්වය අනුව ඔවුන් එය ආලෝකයේ නාමයෙන් නොකරන නිසයි; ඔවුන්ගේ කතාවල මා ගැන සඳහනක් නොමැති බැවිනි; ඔවුන්ගේ අරමුණ නිර්මාතෘවරයා නොවේ; ඔවුන්ගේ අරමුණ සදාකාලිකත්වය ඉදිරිපිට සුසුමක් තරම් කුඩා වන අල්පකාලිකත්වයයි; මම ඔවුන්ගේ මනස කියවමි; මම ඔවුන්ගේ ගණනය කිරීම් දකිමි; මන්ද මම සෑම තැනකම සිටිමි; ඔවුන් ඔවුන්ගේම අඳුරු ලෝක ගොඩනගන බව මම දකිමි; මම ඔබට නියත වශයෙන්ම කියන වග නම්,

තුච්ච උඩඟු පාලකයිනි ඔබ කිසිවෙක් වැඩි කල් පවතින්නේ නැත; මාගේ නියෝග පිළි නොගත් කිසිවකු පවතින්නේ නැත; මා ඔබට සහතික වනවා යම් හෙයකින් ආරම්භයේ සිට මේ ලෝකය නිරහංකාර, සරල අය විසින් කිසි දිනෙක විනිශ්චයක් අවශ්‍ය වන්නේ නැත; විනිශ්චය නිර්මාණය කරන ලද්දේ හිංසාවාදීන් විසින්මය; කිසිම හිංසකයකු පියාණන්ගේ දේශයට ඇතුළු නොවේ; නිතිය සෑම විටම ඔබ තුලම පැවතින; ද්‍රව්‍යය හා ආත්මය සිතන්නේ ඔවුන්ගේම නීති වලට අනුකූලවයි; මන්ද උරුමයක් නැති කිසිවෙක් නොමැත; සියල්ලන්ටම සමාන අයිතීන් පවතී; කිසිවෙක් පියාණන් ඉදිරියෙ සුළු නොවේ; මෙම අයිතීන් සිතාගත හැකි සියලුම ආකාර වලට ප්‍රකට වේ; ඔබ ලෝකය තුළ ඉල්ලා සිටි සියලුම ආකාර ඔවුන්ගේ ආයාචනා යොමු කරනු ඔබ දුටුවේය; ග්‍රහ වාසස්ථාන වලට පැමිණීමට පෙර අනාගත ස්වභාවයේ මූලද්‍රව්‍ය සමඟ සම්මුතියට එළඹෙන ලදී; ඔබේ පැවත්මේදී ඔබ දකින සියල්ලම පාහේ ඔබ දිව්‍යමය

සම්මුතියේදි ඉල්ලා සිටින ලදි; එම හේතුව නිසාම ජෙහෝවා පියාණන්ගේ සජීවී විශ්වය තුළ ද්‍රව්‍ය හා ආත්ම යන කොට්ටාශ දෙකටම විනිශ්චය සඳහා එකම අයිතිය පවතින්නේ; ඒ කොට්ටාශ දෙකටම නිදහස් කැමැත්තක් ඇත; ඒවා එකිනෙකාගෙන් ස්වායක්ත වේ; එය එසේ නුනා තම් යුක්තියේ පරිපූර්ණත්වයක් නොමැතිවනු ඇත; කිසිවකුගේ අයිතීන්වල සමතුලිත බවක් නොමැති වනු ඇත; පියාණන්ගේ යුක්තිය, අනන්ත ආකාර වලින් ප්‍රකට වුවත් එය එකම වනු ඇත; මන්ද ඔහු තුළ පවතින කිසිම දේකට සීමා මායිම් නොමැත; සෑම යුක්තියක්ම ඇති වන්නේ සත්වයන් විසින් සිදු කරන එකම ක්‍රියා වලිනි; ජීවිතයේ හරය එයයි; එය යමෙක්ගේ පැවත්ම තුළින් උගන්නා දෙයම වෙයි; ආත්ම සියල්ලම එකම වේගයෙන් දැනුම ලබා ගන්නේ නැත; සමහරු අනෙක් අයට වඩා වේගයෙන්; මෙම නීතිය ඔබ අතර පවතින කායික අසමානතාව පෙන්නුම් කරයි; ලබා ගන්නා සෑම දැනුමක්ම ඔබ තුළ ස්ථාපනය වේ; නමුත්

අනන්ත කෝණයකින් බැලූ විට සියල්ලම සාපේක්ෂ වේ; ඔබේ සජීවී සාපේක්ෂ අංගවල උපලක්ෂණ හා ප්‍රමිතිය නිර්මාණය කරන්නේ ඔබමයි; උපලක්ෂණ ඇති වන්නේ ඔබේ සිතීමේ මූලධර්ම සහ ස්වර්ගයේ ඔබේ ආධ්‍යාත්මික අනුපිළිවෙළ මතයි; හොඳම තත්ත්වය ලබා ගත හැක්කේ නිහතමානී බව සහ ප්‍රීතියෙන් යුතුව සිදු කරන ක්‍රියා තුළිනි; දෙවියන්ගේ දේශයේ දිව්‍යමය කොමියුනිස්ට් වාදයේ අනුපූරකය හොඳින් නිරීක්ෂණය කරන්න; එය තම ජීවිතය තුළදී සතුටු නොවූ දරුවකුගේ, දර්ශනයෙන් යුතු වූ දිව්‍යමය කොමියුනිස්ට්වාදයකි; එවැන්නෙක් ස්වර්ගයට ඇතුළු වන්නේ නැත; චරිතය මුග්ධ වූ කිසිවකු ඇතුළු වන්නේ නැත; එම මුග්ධ බව හෝ ආවේගය මොහොතක් පමණක් පැවතුනද; ඔබ සියල්ලන්ම ස්වර්ග රාජධානියේදී සෑම අවස්ථාවකදීම සැනසිල්ලේ, සතුටින් කල් ගෙවීමට පොරොන්දු වී ඇත; මුග්ධ වීමෙන් ස්වර්ගයට ඇතුළු විය නොහැකි ඔබ ඔබ දැන සිටියේය; ඔබේ කාලයේදී ඔබ නැවත නැවත

කෝපයට පත් වූයේ තම ඒ මිනිසා විසින් තෝරා ගන්නා ලද අසාධාරණ ජීවන රටාව නිසාය; එවැනි රටාවල නිර්මාතෘන්ට විනිශ්චයයේදී වන්දි ගෙවීමට සිදු වනු ඇත; මන්ද ඔවුන් එසේ ඉල්ලුම් කළ බැවිනි; එය ඔවුනට ප්‍රධානය කරනු ඇත; සූරා කන ධනවාදය ඇති කළ යක්ෂන් මත දිව්‍යමය යුක්තියේ සම්පූර්ණ බලයම යෙදෙනු ඇත; මෙම ආශාවේ හා ප්‍රබලභාවයේ යක්ෂයන් සදාතනික පියාණන්ගේ දිව්‍යමය නීතිය උත්කර්ෂයට පත් කිරීමට උත්වහන්සේට පොරොන්දු වූහ; මෙම ජීවන රටාව යහපත් බව හා සුවපහසුවේ විද්‍යාවේ ඵලයකි; එය මෙම ලෝකයේ රාමුව වේ; එම රාමුව දැන් අවසානයට පත් වෙමින් පවතී; මන්ද අලුත් කාලයක ආරම්භයට පැමිණ ඇත; නව කාලයක්, නව සදාචාරයක්, නව අරමුණක් ඇති නව ලෝකයක්, නිර්මාතෘන් සියල්ලම අලුත් කරන ඔබ නොදන්නෙහිද? අවසන් විනිශ්චය ආරම්භ වනුයේ දෙවියන්ගේ බැටළුවාගෙ දර්ශනය නිසාය; මන්ද යන් දෙවියන්ගේ

නීතිය කඩ කරන සෑම අවස්ථාවකම ඇති වන්නේ වේදනාව පමණක්; ඔබ ජීවිතයේ අයුක්තිය අත්දැක්කේය; එම අයුක්තිය පැන නැග්ගේ දෙවියන් වහන්සේ විසින් නිර්මාණය නොකළ ස්වර්ග රාජ්‍ය විසින් නොදන්නා ජීවන රටාවකිනි.-

ඇල්ෆා සහ ඔමේගා



**දිගු කලක් බලා සිටි අනාවරණය පටන් ගැනුණේ කෙසේද?**

**- ඇල්ෆා සහ ඔමේගා -** හොඳයි, මේ අහන්න; මා උන්නේ අනෙක් අය වාගේමයි; මා සෑම විටම උන්නේ එසේමැයි; වරක් පියාණන් විසින් මා හට පැවසුවේ එකම

වෙනස මෙහිදී මා විසින් අණ පිළිපැදීමයි බවයි; මා ළඟ තවමත් පවතින සටහන් පොතක ලිවීමට ඔහු විසින් මා පොලඹවන ලදී; ඔහු මා හට පණිවුඩයක් දුන්නේය; එහි සඳහන් වූයේ : පුත,ඔබට අවශ්‍ය දෙවියන්ට සේවය කිරීමටද නැතිනම් ඔබේ ලෞකික ජීවිතයදැයි ඔබ විසින් තෝරාගත යුතුය; එය ඔබේ කැමත්තකි; මන්ද අනෙක් සෑම අයෙක්ම වාගේ ඔබත් ඉල්ලා සිටියේ නිදහස් අභිප්‍රායකි; උත්වහන්සේ මට සිතීමට මිනිත්තු තුනක කාලයක් දුන් සේක; ඔබ තේරුම් ගත යුත්තේ උත්වහන්සේ මට තෝරා ගැන්මට අවස්ථාවක් දුන් බවයි; මා සිතා සිටියේ ඔහුට පරචිත්ත විජානන ඥානයෙන් පිළිතුරු දීමටයි - නැත පුත,ඔබ එය ඉල්ලුම් කළේ ලිඛිතවයි.

ජෙහෝවා පියාණනි ,මා ඔබව අනුගමනය කරමි, මන්ද මිනිසා යනු අමරණීය කෙනෙක් නොවේ,අමරණීය අයකු අනුගමනය කිරීමට මා වඩා කැමත්තෙමි.

**සහෝදරයා** : නමුත් එදවස ඔබ කුඩාද?

- **ඇල්ෆා සහ ඔමේගා**: ඔව්,මා කුඩායි.

**සහෝදරයා** : වයස අවුරුදු හතේදි ඔබට සෑම දෙයක්ම වටහා ගැනීමට හැකි වූයේද?

- **ඇල්ෆා සහ ඔමේගා** : ඔව් ඔව්; එම සටහන් පොත තවමත් මා සතුව තිබෙනවා; එම පිටු ගත් වූ දිග කාලය නිසා කහ පැහැ වී ඇත; ඉන් පසු පියාණන් පැවසුවේ :ඔව් පුත්‍රය, මා එය දැන සිටියා,නමුත් ඔබට පරීක්ෂණය සමත් වීමට සිදු වනවාමයි. මන්ද එසේ සමත් නොවීමෙන් ඔබට කිසිදු අත්දැකීමක් නොලැබයි.

**සහෝදරිය** : ඒත් හදිසියේම ඔබව තෝරාගැන්ම නිසා ඔබ පුදුමයට පත් වූයේ නැතිද?

- **ඇල්ෆා සහ ඔමේගා** : මා ඔබට මෙසේ කියන්නම්,සිතිය හැකි සෑම දෙයක්ම දෙවියන්ගෙන් ඉල්ලුම් කළ දෙවල් වේ.අනෙක් අය නිපදවීම් ඉල්ලුම් කළත් මා ඉල්ලුම් කළේ සත්‍යයි.



මෙම පරම්පරාව සඳහා ඉදිරිපත් කෙරෙන දෙවියන්ගේ බුද්ධිමය විනිශ්චය

## අනාගතයේදී සිදු වන දේ.-

ඉදිරියේදී සිදු වන දේ එක් එක් පුද්ගලයා මත රඳා පවතී; මන්ද ලියැවී ඇත්තේ සෑම අයකුම තමන්ගේ ක්‍රියා අනුව විනිශ්චය කෙරෙන බවයි; දිව්‍යමය විනිශ්චය වයස දොළහේ සිට කෙනෙක් තුළ පහළ වූ සියලු අදහස් මත පදනම් වේ; දිව්‍යමය විනිශ්චයට මුහුණ නොදෙන එකම කොට්ඨාශය දරුවන් පමණක් වේ; දිව්‍යමය විනිශ්චය සලකනු ලබන්නේ පරීක්ෂාව සිදු වන කාලය තුළදී වැඩිහිටියන් පමණි; තත්පරයකදී සිතන ලද දේ,

සම්පූර්ණ පැවැත්මේදී සිතන දේට සමාන වේ; එය සිතන ලද ආකාරයට ආලෝකවත් ජීවිතයක් ලබා ගත්තේ හෝ ආලෝකවත්ජීවිතයක් අහිමි කරගත්තේ වේ; දෙවියන්ගේ දේ අසීමිත වේ; ක්ෂුද්‍ර මානසික උත්සාහයක් වෙනුවෙන් පිදෙන උරුමය සර්වකාලීන වේ.-

**ඇල්ෆා සහ ඔමේගා**



අභ්‍යවකාශ විද්‍යාව යනු පරචිත්ත විජානන ලියවිල්ල වන අතර එහි සංකේතය දෙවියන්ගේ බැටළුවා වේ.

මෙම මහා පරිමාණ පරචිත්ත විජානන ලියැවිල්ලේ කතෘන් ඇල්ෆා හා ඔමෙගා වේ.ඔහු 1978 වසර වන විට චිලී හා පේරුවලදී ශුද්ධ ලියැවිලි 4000 ක් පමණ රචනා කොට ඇත.

මෙම අනාවරණය පිළිබඳව අනාවරණ පොතේ ශුද්ධ ලියවීල්ල සහ බැටළුවා (5 වැනි පරිච්ඡේදය) ලෙස කලින් අනාවැකි පවසා ඇත.

මෙම අභ්‍යවකාශ විද්‍යාව සෑම දෙයකම මූලාරම්භයත්, ඉදිරියට සිදු වන්නේ කුමක්ද යන්නත් පැහැදිලි කරයි.

මෙම අනාවරණය වෙනුවෙන් සියවස් ගණනාවක් බලා සිටින ලදී.

එම අනාවරණය පෘතුවිය පුරාම පැතිරෙනු ඇත.සෑම භාෂාවකටම පරිවර්තනය වනු ඇත.එයට සහභාගී නොවන පරිවර්තකයකු

නොසිටිනු ඇත; මන්ද පරිවර්තනය කෙරෙන සෑම අකුරකටම ආලෝක කිරණක් ප්‍රධානය කෙරෙනු ඇත.
මේ දැක්වෙන්නේ මුද්‍රා වල අනාවරණයයි; එයින් අදහස් කෙරෙනුයේ පියාණන් විසින් එවනු ලැබූවක් පමණක් යන්නයි,ඔබට දෙවියන්ගේ බැටළුවාගේ ශුද්ධ ලියැවිල්ල ලිවිය හැක.
දෙවියන්ගේ බැටළුවාගේ සියලුම අනාවරණ තුනී කඩදාසි හා ඝන කඩදාසි වලින් නිම වූ සත්තස් වල ලියැවී ඇත; ලෝකයට දායාද කිරීමෙන් අනතුරුව ශුද්ධ ලියැවිල්ල සම්පූර්ණ වනු ඇත,ඒවායේ දැනුමට කෙලවරක් නොවනු ඇත.

ආයුබෝවන්,ඔබව මිනිස් පරිවර්තනය කිරීමේ ව්‍යපෘතියට පිලිගනිමු. අප පරචිත්ත විජානනය පණිවිඩයේ පරිවර්තන ඉදිරිපත් කරන්නේ එහි ආරම්භක හෝ ඇල්ෆා අදියරෙනි.
මෙම පණිවිඩය රචනා කොට තිබුණේ ප්‍රංශ භාෂාවෙනි.
ග්‍රහ ප්‍රජාව මෙම පරිවර්තන අනුමත කළ යුතුය.එමගින් යෝජනා වන්නේ හොඳම පරිවර්තන වේ.
ඔබට ක්ලික් කිරීමෙන් මෙම පොත පහසුවෙන්ම බාගත හැක.

කරුණාකර පහත වෙබ් පිටුව භාවිතා කර තාරකා විද්‍යාව හා ඉදිරියට සිදු වන දේ පිළිබඳව කියවන්න.
https://www.alfayomega.com/si/


ALPHA AND OMEGA
CELESTIAL SCIENCE
ALPHA AND OMEGA
CELESTIAL SCIENCE
THE DOCTRINE OF THE LAMB OF GOD
WHAT IS TO COME
ALPHA AND OMEGA
Telepathic Scripture
EVENTS THAT WILL OCCUR IN INDIA
ALPHA AND OMEGA